
# දඟ වඳුරු පැටියා



කතෘගේ නම
එස්.එම්. මිනුලි ඩිහන්සා මෙත්සදි බංඩාර



# දඟ වඳුරු පැටියා

කතෘගේ නම
එස්.එම්. මිනුලි ඩිහන්සා මෙත්සදි බංඩාර

# දඟ වඳුරු පැටියා

කතාව සහ චිත්‍ර
එස්.එම්. මිනුලි ඩිහන්සා මෙත්සදි බංඩාර
කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2025 පෙබරවාරි 08

ISBN No : 978-624-208-524-1

4 ශ්‍රේණිය B
මහාමායා බාලිකා විදුහල - මහනුවර.

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට
වෙර දරන, මාගේ සදාදරණීය
විදුහල්පතිතුමිය, පන්තිභාර ගුරුතුමිය,
ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,
මා පෝෂණය කරන ඇති දැඩි කරන
මාගේ ආදරණීය දෙමාපියන්ටද,
සහෝදර, සහෝදරියන්ටද,
මාගේ මිතුර මිතුරියන් සියළු දෙනාටම මෙම
පොත ආදර ගෞරවයෙන්
යුක්තව පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකෝමත් එක දවසක කැලෑවක අඹ ගසක වඳුරු අම්මයි, තාත්තායි, වඳුරු පැටියයි ජීවත් වුණා. වඳුරු පැටියා හරිම දඟයි. ඒ වාගේම කෑදරයි, අම්මයි, තාත්තායි කියන දේවල් ඇහුවෙත් නෑ.

එක දවසක් වඳුරු පැටියා සෙල්ලම් කරමින් හිටියා. අම්මා කිවුවා, වඳුරු පැටියාට “ පුතේ පරිස්සමෙන් ඉන්න.” කියලා. අම්මයි, තාත්තායි කෑම හොයාගෙන එන්න කැලේ ඇතුළට ගියා.  ඒ වෙලාවේ වඳුරු පැටියා ගසින් ගසට පැන පැන සෙල්ලම් කළා දකින දකින පලතුරු කෑවා.



වඳුරු පැටියා දැක්කා, රතුම රතු ජම්බු ගෙඩියක්. වඳුරු පැටියා ජම්බු ගෙඩිය ළඟට ගියා. වඳුරු පැටියා ජම්බු ගෙඩිය කඩා ගත්තා. ජම්බු ගෙඩිය කන්න පටන් ගත්තා. එකක් කනකොට පැටියාට කෑදර හිතිලා ජම්බු ගෙඩි ගොඩක් කඩාගෙන කෑවා.

පැටියාගේ බඩ හොඳට ම රිදෙන්න පටන් ගත්තා. එයා ගහෙන් බැහැලා බිම වැතිරිලා කෙඳිරි ගාමින් හිටියා.



පැටියාගේ ඇහෙන් කදුළු වැටුණා. අම්මයි, තාත්තායි ගහට එන කොට පැටියා හිටියේ නෑ. අම්මායි තාත්තායි හොඳටම බය වුණා. අම්මා පැටියාට කතා කරමින් හැම තැනම පැටියාව සෙවුවා.



පැටියා ළඟට අලි පැංචෙක් ආවා. අලි පැංචා තමයි වඳුරු පැටියාගේ යාළුවා.

“පැටියෝ මොකද වුණේ ?”

“මම ජම්බු ගෙඩි ගොඩක් කෑවා. දැන් මගේ බඩ රිදෙනවා, එකයි මම අඬන්නේ කියලා.”

අලි පැංචා වඳුරු පැටියා දිහා හොඳින් බැලුවා. අලි පැංචා එතකොට මෙහෙම කිවුවා.


“පැටියෝ කෑම දැකලා කෑදරකමට කන්න හොඳ නෑ. තමන්ට ඇති ප්‍රමාණයට කන්න. වැඩි කෑදර කම හොඳ නෑ කියලා කිවුවා.”

එහෙම කියපු අලි පැංචා කැලේ ඇතුළට ගිහිල්ලා බෙහෙත් හොයාගෙන ආවා. බෙහෙත් වඳුරු පැටියට දුන්නා.



අම්මා දැක්කා වඳුරු පැටියා අලි පැංචා එක්ක ගහක් යට ඉන්නවා.





අම්මා අඬාගෙන පැටියා ළඟට ගියා. අම්මා ඇහුවා මොකද පුතේ වුණේ කියලා වඳුරු පැටියා වුණ හැමදේම අම්මාට කිව්වා. අම්මා අලි පැංචට ස්තූති කරලා පැංචාව ගෙදර එක්කරන් ගියා.

එදා ඉදන් පැටියා දඟ කෙරුවෙත් නෑ, කෑදර කමට කන්න ගියෙත් නෑ, අම්මයි, තාත්තායි කියන දේවල් අහගෙන සතුටින් හිටියා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්